# 2022 ඔක්තෝබර් මස 18 වන දින ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභා රැස්වීම් වාර්තාව

දිනය සහ වේලාව :- 2022.10.18 පෙ:ව: 09.30

ස්ථානය :- ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව

පැමිණීම:-

| | |
|---|---|
| 01. පී.ඕ.පී.ඩී. නදීර බණ්ඩාර ජයසේකර මහතා | ගරු ප්‍රාදේශීය සභා සභාපති |
| 02. ඒ. මහින්දරත්න අලුත්ගමගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා උප සභාපති |
| 03. ආර්.පී. ගුණරත්න මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 04. එස්.ඒ.ඩබ්. පතිරණ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 05. ඩී.ඩබ්.නාලක වසන්ත අබේසේකර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 06. එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 07.චන්ද්‍රා අලුත්ගමගේ මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 08.ඒ.පී. කොල්වින් සිල්වා මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 09. ඩී.පී.පී. විශ්වජිත් ගංගා ප්‍රේමලාල් ගුරුගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 10. සුබෝධා ලක්ෂාණි රිබේරා මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 11. ඩබ්.එම්. උදය කුමාර බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 12. එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 13. පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 14. එම්.පී. අබේරත්න බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 15. එස්. නිලාම් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 16. ඩී.පී. නිරෝෂා දිල්රුක්ෂිකා ජයසේකර මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 17. එස්.පී. සරත් කුමාර ලාල් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 18. රාජකුමාර් විදුෂණී මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 19. එන්.එම්. නන්දාවතී මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 20. ආර්.පී. පී. ඉෂංකා ලක්මාලි සෙනෙවිරත්න මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |

නොපැමිණි -

| | |
|---|---|
| 01. ඒ.ඒ. අජිත් ප්‍රියන්ත බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 02.ආර්.එම්.චාමික අනුරාධ රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 03.එච්.පී. ආනන්ද කුලතිලක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |

ගරු සභාපතිතුමා

ගරු සභාපතිතුමා විසින් මහා සභා රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරමින් පැමිණ සිටි ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා, ගරු මන්ත්‍රීතුමියන්ලා, ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ඇතුළු නිලධාරීන් සියලුදෙනා හා පැමිණ සිටි සියලුදෙනාම ගෞරවයෙන් යුතුව පිළිගන්නා ලදී. සභා රැස්වීමට සහභාගීවූ සියල්ලෝම තම ආගම සිහිකර ජාතික ගීය ගායනා කිරීමෙන් පසුව මියගිය රණවිරුවන් හා මියගිය පළාත් පාලන ආයතන නියෝජිතයින් සිහිකර විනාඩියක නිශ්ශබ්දතාවයක් පවත්වන ලදී. ඉන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් න්‍යාය පත්‍රානුකූලව පසුගිය සභා වාර්තාව ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

01.පසුගිය සභා වාර්තාව සම්මත කර ගැනීම

2022 සැප්තැම්බර් මස 20 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සම්මත කර ගැනීමට ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්. උදය කුමාර බණ්ඩාර මහතා

ගරු සභාපතිතුමනි, පසුගිය සභා වාර්තාවේ පිටු අංක 13හි "ගනේවත්ත මාර්ගය" යන්න "ගඟේවත්ත මාර්ගය" වශයෙන් සංශෝධනය විය යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එන්.එම්. නන්දාවතී මහත්මිය

ගරු සභාපතිතුමනි,පිටු අංක 13හි සඳහන් මාගේ ප්‍රකාශයෙහි "ගරු" පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි වශයෙන් සංශෝධනය විය යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි

පිටු අංක 46හි සඳහන් මාගේ ප්‍රකාශයෙහි මා පැවසුවේ රෝහල සහ බැංකුව නගරයට ගෙනයාම සම්බන්ධව ජනතාව චෝදනා කරන බවයි.එය සංශෝධනය කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සේවය කර ස්ථාන මාරු ලැබූ නිලධාරීන්ගේ සේවය අගයමින් මා විසින් කළ ස්තූති කතාව සභා වාර්තාවේ අන්තර්ගත කර තිබුණේ නැහැ.එය අන්තර්ගත විය යුතුයි.වෙනත් සංශෝධන ඇත්නම් ඉදිරිපත් කරන ලෙසත් එසේ නොමැතිනම් පසුගිය සභා වාර්තාව සම්මත කිරීම සුදුසුයි.

පෙ.ව.09.50ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.පී. කොල්වින් සිල්වා මහතා සභා ගර්භයට පැමිණියේය.

පෙ.ව.09.53ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩී.පී. නිරෝෂා දිල්රුක්ෂිකා ජයසේකර මහත්මිය සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. නිලාම් මහතා සභා ගර්භයට පැමිණියහ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 2022.09.20 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධන වලට යටත්ව සත්‍ය වාර්තාවක් බවට මා විසින් යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

යෝජනා ස්ථිරත්වයෙන් අනතුරුව 2022.09.20 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධන වලට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.

## 02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන - ඇත

01. 2022 ජූනි සහ ජූලි මාසවලට අදාළ මහා සභා රැස්වීම් වාර්තාවල නිරීක්ෂණ ඇතුළත් කරමින් පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය විසින් ඉදිරිපත් කර ඇති ලිපි සභා ගත කරමි.

02. ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව මගින් දැනට වැටකේදෙණිය සහ ගල්පාය වසම්වල පවත්වාගෙන යනු ලබන සය මාසික මැහුම් පාඨමාලා අවසන් වීමට නියමිත බැවින් මිළඟට දොළොස්බාගේ සහ වල්ලහගොඩ ප්‍රදේශ ආවරණය වන පරිදි එම මැහුම් පාඨමාලා ආරම්භ කිරීමට යෝජිතව ඇති අතර ඒ පිළිබඳව ප්‍රදේශයේ ජනතාව දැනුවත් කරන ලෙස ගරු මහා සභාවට නිවේදනය කරමි.

03. ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු වත්කම් හඳුනා ගැනීම සඳහා 2019 වර්ෂයේ පත්කරන ලද වත්කම් සමීක්ෂණ මණ්ඩලයේ නිලධාරීන් ස්ථානමාරු ලැබීම නිසා ඒ වෙනුවට පහත නම් සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත නව වත්කම් සමීක්ෂණ මණ්ඩලයක් පත් කරන ලද බව ගරු මහා සභාවට නිවේදනය කරමි.

1. ඩී.ඩබ්.නාලක වසන්ත අබේසේකර මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

2.එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

3.පී.බී.එන්.එම්.රොද්‍රිගෝ මයා - සංවර්ධන නිලධාරී

4.එන්.එම්.ඩී.පී.බණ්ඩාර මයා - සංවර්ධන නිලධාරී

5.කේ.ඒ.අයි.වික්‍රමසිංහ මිය - සංවර්ධන නිලධාරී (අභ්‍යන්තර විගණන)

6.ඩී.ඒ.එන්.පී.ජයසේකර මයා - තාක්ෂණ නිලධාරී

7.ඩබ්.ජේ.පී.ගුණරත්න මයා - ආදායම් පරීක්ෂක

04. මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2022-09-05 වන දින කුරුණෑගල ප්‍රදේශයේ පාසල් සිසුවෙකු අනාරක්ෂිත බෝක්කුවකට වැටීමෙන් මිය ගිය සිදුවීම සමග එවැනි සිදුවීම් මධ්‍යම පළාත තුළ සිදුවීම වළක්වා ගැනීම පිළිබඳව රාජ්‍ය නිලධාරීන් දැනුවත් කර ඇති අතර ඒ සම්බන්ධව යොමු කර ඇති ලිපි මගින් දක්වා ඇති පරිදි අවශ්‍ය කඩිනම් පියවර ගැනීමට කටයුතු කරන ලෙස දන්වමින් පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභා ගත කරමි.

05. ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී අත්‍යවශ්‍යයෙන්ම ක්‍රියාත්මක කළයුතු ව්‍යාපෘති හඳුනාගෙන ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා යොමු කරන ලෙසත් යම් සාධාරණ හේතුවක් මත ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගත් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක නොකරන්නේ නම්,ඒ සඳහා මහා සභා අනුමැතියක් ලබාගෙන ගරු ආණ්ඩුකාරතුමා ද දැනුවත් කළහැකි වන පරිදි අදාළ ව්‍යාපෘතිය අවලංගු කිරීම සම්බන්ධයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස්වරයා දැනුවත් කරන ලෙසත් දන්වමින් පළාත් පාලන කොමසාරිස් විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභා ගත කරමි.

06. මුදල් අමාත්‍යංශ ලේකම්ගේ හා රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු ,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යංශ ලේකම්ගේ උපදෙස් පරිදි බල ප්‍රදේශයේ වර්ෂාවෙන් හා ජල ගැලීම්වලින් හානියටපත් මාර්ග පිළිසකර කර ගැනීමේ වැඩපිළිවෙලක් සකස් කර ගන්නා ලෙසත් පළාත් පාලන ආයතනයන්හි පොදු ජනතාව වෙත සපයන සේවා වෙනුවෙන් අයකරනු ලබන බදු ආදායම් උපයෝගී කරගනිමින් පළාත් පාලන ආයතනවල අත්‍යවශ්‍ය පොදු පහසුකම් නඩත්තු කිරීම සහ පවත්වාගෙන යාමටත් කටයුතු කරන ලෙස දන්වමින් පළාත් පාලන කොමසාරිස් විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභා ගත කරමි.

07.2022 වර්ෂයේ සභා අරමුදල් ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලද,ගිවිසුම්ගත සහ ක්‍රියාත්මක කිරීමට නියමිත නමුත් මෙතෙක් වැඩ අවසන් නොකළ ව්‍යාපෘතිවල 2022-12-15 දිනට පෙර වැඩ අවසන් කරන ලෙසත් එසේ වැඩ අවසන් නොකරන ව්‍යාපෘති 2023 වර්ෂය සඳහා ණය හිමි නොකරන බවත් ගරු මහා සභාවට නිවේදනය කරමි.

08. 2022/09/26 වන දින සිට ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ඇත්ගාල උප කාර්යාලයේ කාර්යභාර නිලධාරී ලෙස සී.කේ.පී.පුංචිහේවා මෙනවිය පත් කර ඇති බව ගරු මහා සභාවට නිවේදනය කරමි.

## 03. සභාවට ලැබී ඇති සංදේශ, පෙත්සම්, පැමිණිලි, හා සන්නිවේදන - නැත

04. යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න - නැත

05.යථා පරිදි කල්දී ඇති යෝජනා - ඇත

05:01 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

05:01:01:ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

2023 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද අය-වැය කෙටුම්පත සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට යෝජනා කරමි.

(අ) ආදායම්

(அ)வருமானங்கள்

*පුනරාවර්ථන ආදායම* நடைமுறை வருமானம் රු. 131,490,900.00

*ප්‍රාග්ධන ලැබීම්* மூலதன வருமானம் රු. 65,000,000.00

*අපේක්ෂිත මුළු ආදායම් එකතුව* எதிர்பார்க்கும் மொத்த வருமானம் රු. 196,490,900.00

(ආ)වියදම්

(ஆ)செலவினங்கள்

*පුනරාවර්ථන වියදම* நடைமுறை செலவு රු. 79,131,960.00

*ප්‍රාග්ධන වියදම*மூலதனச் செலவு රු.117,358,410.00

*අපේක්ෂිත මුළු වියදම් එකතුව* எதிர்பார்க்கும் மொத்தச் செலவு රු.196,490,370.00

*(ඇ) ශුද්ධ අතිරික්තය* தேறிய மிகுதி රු. 530.00

පුනරාවර්ථන ආදායම් හා වියදම් වැඩසටහන් අනුව

**வேலைத்திட்டங்களுக்கேற்ப நடைமுறை வருமான செலவுகள்**

| වැඩසටහන<br>வேலைத்திட்டம் | ආදායම<br>රු. | වියදම<br>රු. |
|---|---|---|
| 01 වැඩසටහන් வேலைத்திட்டம் | 77,076,680.00 | 39,966,360.00 |
| 02 වැඩසටහන් வேலைத்திட்டம் | 10,774,160.00 | 13,714,800.00 |
| 03 වැඩසටහන් வேலைத்திட்டம் | 38,814,760.00 | 18,357,200.00 |
| 04 වැඩසටහන් வேலைத்திட்டம் | 1,366,600.00 | 1,089,600.00 |
| 05 වැඩසටහන් வேலைத்திட்டம் | 890,000.00 | 580,000.00 |

| | | |
|---|---|---|
| 06 වැඩසටහන් வேலைத்திட்டம் | 2,568,700.00 | 5,424,000.00 |
| එකතුව மொத்தம் | 131,490,900.00 | 79,131,960.00 |

## 2023- පුනරාවර්ථන ආදායම් ඇස්තමේන්තුව -2023 நடைமுறை வருமான மதிப்பீடு

| අනු අංකය தொ.இல | වැඩසටහන வேலைத்திட்டம் | පුනරාවර්ථන ආදායම நடைமுறை செலவினம் රු. |
|---|---|---|
| 10 | වරිපනම් හා බදු வரிப்பணம் மற்றும் குத்தகை | 5,982,520.00 |
| 20 | කුලී வாடகை | 20,937,500.00 |
| 30 | බලපත්‍ර ගාස්තු உரிமக்கட்டணம் | 1,325,100.00 |
| 40 | සේවා සඳහා ගාස්තු சேவைக்கட்டணம் | 9,429,500.00 |
| 50 | වරෙන්තු ගාස්තු හා දඩ பிடியாணை மற்றும் தண்டப்பணம் | 2,927,000.00 |
| 60 | වෙනත් ආදායම් ஏனைய வருமானம் | 49,716,500.00 |
| 70 | ආදායම් ආධාර நன்கொடை வருமானம் | 41,172,780.00 |
| | මුළු එකතුව மொத்தம் | 131,490,900.00 |

## 2023 - පුනරාවර්ථන වියදම් ඇස්තමේන්තුව - 2023 நடைமுறை செலவின மதிப்பீடு

| අනු අංකය தொ.இல | වැඩසටහන வேலைத்திட்டம் | පුනරාවර්ථන වියදම நடைமுறை செலவினம் රු. |
|---|---|---|
| 1 | වැටුප් හා දීමනා சம்பளம் மற்றும் கொடுப்பனவு | 51,301,120.00 |
| 2 | ගමන් වියදම් பிரயாணச் செலவு | 675,000.00 |
| 3 | සැපයුම් හා උපකරණ வழங்கல்கள் மற்றும் உபகரணங்கள் | 8,346,500.00 |
| 4 | ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තුව நிலையான சொத்துக்கள் புதுப்பிப்பு மற்றும் பராமரிப்பு | 8,500,000.00 |
| 5 | ප්‍රවාහන සම්බන්ධතා හා වෙනත් සේවා போக்குவரத்து தொடர்புகள் மற்றும் ஏனைய சேவைகள் | 5,023,000.00 |
| 6 | පොළී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් வட்டி கொடுப்பனவு, பங்கிலாபம் | 2,551,600.00 |
| 7 | ආධාර මුදල් දායක මුදල් හා සහනාධාර நன்கொடை,சந்தா மற்றும் நிவாரணங்கள் | 2,330,500.00 |

| | | |
|---|---|---|
| 8 | විශ්‍රාම වැටුප්/විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික ஓய்வூதியம்/ஓய்வூதிய இலாபங்கள் | 404,240.00 |
| | එකතුව மொத்தம் | 79,131,960.00 |

2023 වර්ෂය සඳහා පුනරාවර්ථන අයවැය අතිරික්තයෙන් අපේක්ෂිත ප්‍රාග්ධන වැය
2023 ஆம் ஆண்டிற்கான நடைமுறை வரவு செலவுத்திட்ட மீதத்தில் எதிர்பார்க்கப்படும் நிலையான செலவு

| අනු අංකය/தொ.இல | විස්තරය விபரம் | මුදල தொகை (රු.) |
|---|---|---|
| 1 | කාර්යාලය සඳහා ලී බඩු හා උපකරණ அலுவலக தளபாடங்கள் மற்றும் உபகரணங்கள் | 50,000.00 |
| 2 | උලපනේ ඩෙන්මාර්ක් කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම | 250,000.00 |
| 3 | කාර්යාලය සඳහා පරිගණක හා උපාංග /ප්‍රින්ටර් கணினி மற்றும் உதிரிப்பாகங்கள் | 450,000.00 |
| 4 | සංවර්ධන ව්‍යාපෘති ( ගරු සභාපති ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලය) அபிவிருத்தி திட்டங்கள் (கௌரவ தலைவர் உள்ளிட்ட சபை உறுப்பினர்கள்) | 26,000,000.00 |
| 5 | සංවර්ධන ව්‍යාපෘති ( සභා අරමුදල් - වෙනත්) அபிவிருத்தி திட்டங்கள்(சபை நிதி, ஏனையவை) | 4,000,000.00 |
| 6 | පුස්තකාල පොත් ලබාගැනීම நூலக புத்தக கொள்வனவு | 500,000.00 |
| 7 | දේශීය ණය හා සංවර්ධන අරමුදලට ණය වාරික ගෙවීම தேசிய கடன் மற்றும் அபிருத்தி நிதியத்துக்கு தவணை கடன் செலுத்துதல் | 8,808,410.00 |
| 8 | කාය වර්ධන මධ්‍යස්ථානයට උපකරණ ලබාදීම | 100,000.00 |
| 9 | පුස්තකාල සඳහා කාර්යාල උපකරණ/ලී බඩු ලබා ගැනීම நூலகத்துக்காக அலுவலக உபகரணங்கள்/மரத்தளப்பாடங்கள் பெற்றுக்கொள்ளல் | 100,000.00 |
| 10 | සංචාරක ආකර්ශනීය ස්ථාන සංවර්ධනය කිරීම (අසුපිණිඇල්ල සංචාරක ව්‍යාපෘතිය) | 2,000,000.00 |
| 11 | කුරුඳුවත්ත නව වෙළඳ සංකීර්ණය ඉදිකිරීම | 10,000,000.00 |
| 12 | වැඩ ඒකකය සඳහා උපකරණ | 100,000.00 |
| | මුළු එකතුව மொத்தம் | 52,358,410.00 |

| | | |
|---|---|---|
| | 2023 වර්ෂය සඳහා ලැබේ යැයි අපේක්ෂිත ප්‍රාග්ධන ආධාර 2023 ஆம் ஆண்டிற்காக எதிர்பார்க்கப்படும் மூலதன நன்கொடை | |

| අනු අංකය தொ.இல | විස්තරයவிபரம் | මුදල தொகை (රු.) |
|---|---|---|
| | පළාත් සභා මන්ත්‍රී ආධාර/ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන/තුලිත ආර්ථික/ හුදෙකලා හා පසුගාමී සංවර්ධන වැඩසටහන/ වතු යටිතල පහසුකම් අමාත්‍යාංශ ප්‍රදානමாகாண சபை உறுப்பினர் நிதி/ மாகாண நிரந்தர அபிவிருத்தி நிதி /சீரான பொருளாதாரம் /பின் தங்கிய கிராமங்களுக்கான அபிவிருத்தி வேலைத்திட்டங்கள் /தோட்ட உட்கட்டமைப்பு அமைச்சின் நிதி | **65,000,000.00** |
| | මුළු එකතුවமொத்தம் | 65,000,000.00 |

## 2023 වර්ෂයේ පුනරාවර්ථන ආදායම් ඇස්තමේන්තු සාරාංශය

## 2023 ஆம் ஆண்டிற்கான நடைமுறை வருமான மதிப்பீட்டு சாராம்சம்

| අය සංකේතය வரவுக்குறியீடு | 2021 සත්‍ය ආදායම மெய்வருமானம் රු. | 2022 ඇස්තමේන්තුව மதிப்பீடுරු. | 2023 ඇස්තමේන්තුව மதிப்பீடு රු. |
|---|---|---|---|
| 10 - වරිපනම් හා බදු வரிப்பணம் மற்றும் குத்தகை | **3,311,315.00** | **4,435,115.00** | **5,982,520.00** |
| 20 - කුලී வாடகை | **7,322,256.00** | **19,903,000.00** | **20,937,500.00** |
| 30 - බලපත්‍ර ගාස්තු உரிமக்கட்டணம் | **1,034,250.00** | **1,175,100.00** | **1,325,100.00** |
| 40 - සේවා සඳහා ගාස්තු சேவைக்கட்டணம் | **6,154,927.00** | **10,557,000.00** | **9,429,500.00** |
| 50 - වරෙන්තු ගාස්තු හා දඩ பிடியாணைக்கட்டணம் மற்றும் தண்டப்பணம் | **1,461,975.00** | **2,247,000.00** | **2,927,000.00** |
| 60 - වෙනත් ආදායම් ஏனைய வருமானங்கள் | **27,164,636.00** | **28,039,500.00** | **49,716,500.00** |
| 70 - ආදායම් ආධාර நன்கொடை வருமானம் | **11,013,885.00** | **38,228,497.00** | **41,172,780.00** |
| මුළු එකතුව மொத்தம் | **57,463,244.00** | **104,585,212.00** | **131,490,900.00** |

## 2023 වර්ෂයේ පුනරාවර්ථන වියදම් ඇස්තමේන්තු සාරාංශය

## 2023 ஆம் ஆண்டிற்கான நடைமுறை செலவின மதிப்பீட்டு சாராம்சம்

| වැය සංකේතය செலவினக்குறியீடு | 2021 සත්‍ය වියදම மெய் செலவினம் රු. | 2022 ඇස්තමේන්තුව மதிப்பீடு රු. | 2023 ඇස්තමේන්තුව மதிப்பீடு රු. |
|---|---|---|---|
| 1 - වැටුප් හා දීමනාசம்பளம் மற்றும் கொடுப்பனவுகள் | **34,584,374.00** | **42,248,457.00** | **51,301,120.00** |
| 2 - ගමන් වියදම්பிரயாணச்செலவு | **428,495.00** | **675,000.00** | **675,000.00** |
| 3 - සැපයුම් හා උපකරණவழங்கல்கள் மற்றும் உபகரணங்கள் | **5,962,193.00** | **6,539,000.00** | **8,346,500.00** |
| 4 - ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා | **3,523,848.00** | | **8,500,000.00** |

| | | | |
|---|---|---|---|
| நடைத்துவநிலையான சொத்துக்கள் புதுப்பிப்பு மற்றும் பராமரிப்பு | | 4,650,000.00 | |
| 5 - ප්‍රවාහන සම්බන්ධතා හා වෙනත් සේවාපோக்குவரத்துடன் தொடர்புடைய ஏனைய சேவைகள் | 3,088,602.00 | 4,406,500.00 | 5,023,000.00 |
| 6 - පොළී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද முதல் வட்டி செலுத்துதல், பங்கிலாபம், வெகுமதிகள் | 793,964.00 | 1,539,098.00 | 2,551,600.00 |
| 7 - ආධාර මුදල් දායක මුදල් හා සහනාධාර நன்கொடை சந்தா மற்றும் நிவாரணங்கள் | 630,173.00 | 1,833,500.00 | 2,330,500.00 |
| 8 - විශ්‍රාම වැටුප්/විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික ஓய்வூதியம்/ஓய்வூதிய இலாபங்கள் | 161,102.00 | 404,240.00 | 404,240.00 |
| මුළු එකතුව | 49,172,751.00 | 62,295,795.00 | 79,131,960.00 |

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය පට්ටිපොළ සුමනරතන හිමි</u>

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කළ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

<u>ගරු සභාපතිතුමා</u>

2023 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය කෙටුම්පතේ ආදායම් වියදම් සාරාංශය පිළිබඳ සාකච්ඡා කිරීමේදී පුනරාවර්ථන ආදායම රු.131,490,900.00ක්ද ප්‍රාග්ධන ලැබීම් රු.65,000,000.00 ක්ද වශයෙන් අපේක්ෂිත මුළු ආදායම් එකතුව රු.196,490,900.00ක් වේ. පුනරාවර්ථන වියදම රු.79,131,960.00ක්ද ප්‍රාග්ධන වියදම රු.117,358,410.00ක්ද අපේක්ෂිත මුළු වියදම් එකතුව රු.196,490,370.00ක්ද වේ. එසේම ආදායම් වියදම් සාරාංශය හා වැඩසටහන් විස්තරාත්මකව මෙම කෙටුම්පතේ සඳහන් කර ඇත. ඒ අනුව 2023 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය කෙටුම්පත සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මෙම අයවැය පිළිබඳව ගරු මහා සභාවේ අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී. අබේරත්න බණ්ඩාර මහතා</u>

ගරු සභාපතිතුමනි,අයවැය කෙටුම්පත මගින් කිසිදු ප්‍රතිපාදන මුදලක් නොලැබීම නිසා මෙම අයවැය කෙටුම්පතට මාගේ විරෝධතාවය ප්‍රකාශකර සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී. සරත් කුමාර ලාල් මහතා</u>

ගරු සභාපතිතුමනි,අයවැයෙන් වෙන්කර ඇති ප්‍රතිපාදනවලින් යම් ප්‍රතිශතයක් හෝ අපවෙත ලබාදෙන්නේ නම් වඩාත් සුදුසු බව මගේ අදහසයි.රට අස්ථාවරව පැවති අවස්ථාවේ රට එයින් මුදාගත්තේ අපේ පක්ෂයේ ගරු නායකතුමා ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා විසින් වන අතර එතුමා මෙම රජයේ ජනාධිපතිවරයා වශයෙන් කටයුතු කරනවා.සාමය සුරකින ජනතාවක් ලෙස ඉදිරි වර්ෂයේත් අපි සාමයෙන් කටයුතු කරමු.ජනතාව කළකිරීමට පත්ව සිටින බැවින් එක් පාර්ශවයකට හෝ ඡන්දය නොදිය යුතුය යන ස්ථාවරයක සිටිනවා.එබැවින් අපට යම් ප්‍රතිපාදන මුදලක් ලබාදෙන්නේ නම් යම් සේවාවක් ඔවුන් වෙනුවෙන් සිදුකළ හැකියි.මෙම අයවැය කෙටුම්පත සඳහා මම පක්ෂව ඡන්දය ලබාදෙනවා.

පෙ.ව.10.07ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ඩබ්.නාලක වසන්ත අබේසේකර මහතා සභා ගර්භයට පැමිණියේය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එන්.එම්. නන්දාවතී මහත්මිය

ගරු සභාපතිතුමනි,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී. සරත් කුමාර ලාල් මහතා ප්‍රකාශ කළ පරිදි අපටත් යම් සේවාවක් සිදුකිරීම සඳහා ප්‍රතිපාදන ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.මම මෙම අයවැය කෙටුම්පතට පක්ෂ බව ප්‍රකාශ කර සිටිනවා.

ගරු සභාපතිතුමා

මෙවර අයවැය තුළින් නිලධාරීන්ගේ ගමන් වියදම්,අතිකාල දීමනා විශාල වශයෙන් අඩු කර තිබෙනවා.නමුත් ඉන්ධන සම්බන්ධයෙන් ගත්විට ඒ වියදම් වැඩිවී තිබෙනවා.මෙවර කොට්ඨාසයකට ලක්ෂ 20ක් වෙන්කර තිබෙන අතර ඒ පිළිබඳව කොට්ඨාසයේ මන්ත්‍රීවරුන් සාකච්ඡා කර තීරණ ගැනීම සුදුසුයි.අතිරික්ත ප්‍රාග්ධන වැය සඳහා රු.4,000,000.00ක් වෙන්කර තිබෙනවා.පුස්තකාලයක් සැකසීමට සහ ඔබතුමන්ලාගේ යෝජනා ප්‍රමුඛතා ගතකොට එයින් ප්‍රමුඛතම යෝජනා ක්‍රියාවට නැංවීම සඳහා එම මුදල් යෙදවිය හැකියි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඒ. මහින්දරත්න අලුත්ගමගේ මහතා

ගරු සභාපතිතුමනි, වෙන්කර ඇති ලක්ෂ 40න් සාධාරණ මුදලක් එම මන්ත්‍රීවරුන්ගේ යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා ලබා දෙන ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩී.පී. නිරෝෂා දිල්රුක්ෂිකා ජයසේකර මහත්මිය

රට අස්ථාවරව තිබූ අවස්ථාවේ රට බේරාගනු ලැබුවේ මාගේ පක්ෂ නායක ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා විසින් බව මෙහිදී සිහිපත් කළ යුතුයි.මෙම අයවැය කෙටුම්පත සඳහා මම පක්ෂ බවත් ප්‍රකාශ කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී රාජකුමාර් විදුෂණී මහත්මිය

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.අයවැය කෙටුම්පත සඳහා මම පක්ෂ බව ප්‍රකාශ කර සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ආර්.පී. පී. ඉෂංකා ලක්මාලි සෙනෙවිරත්න මහත්මිය

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.අයවැය කෙටුම්පත සඳහා මම ද පක්ෂ බව ප්‍රකාශ කර සිටිනවා.

ගරු සභාපතිතුමා

ප්‍රතිපාදන බෙදී යන ආකාරය සම්බන්ධව කොට්ඨාසයේ මන්ත්‍රීවරුන් සාකච්ඡා කොට ප්‍රමුඛ යෝජනා හඳුනාගෙන තීරණ ගැනීම සුදුසු බව මගේ අදහසයි.වෙනත් අදහස් ඉදිරිපත් කිරීමක් නොමැති බව පෙනී යනවා. ඒ අනුව 2023 වර්ෂය සඳහා සකස් කළ අයවැය කෙටුම්පත සම්මත කරගැනීම සඳහා ඡන්ද විමසීම ආරම්භ කිරීම සුදුසුයි.

2023 වර්ෂය සඳහා සැකසූ අයවැය කෙටුම්පතට පක්ෂව ඡන්දය ලබා දීම ආරම්භ කරන්න. අත් ඔසවා ඡන්දය ප්‍රකාශ කරන්න.

| | | |
|---|---|---|
| 01. පී.ඕ.පී.ඩී. නදීර බණ්ඩාර ජයසේකර මහතා | ගරු ප්‍රාදේශීය සභා සභාපති | - පක්ෂයි |
| 02. ඒ. මහින්දරත්න අලුත්ගමගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා උප සභාපති | - පක්ෂයි |
| 03. ආර්.පී. ගුණරත්න මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 04. එස්.ඒ.ඩබ්. පතිරණ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 05. ඩී.ඩබ්.නාලක වසන්ත අබේසේකර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 06. එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 07.චන්ද්‍රා අලුත්ගමගේ මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - පක්ෂයි |

| | | |
|---|---|---|
| 08.ඒ.පී. කොල්වින් සිල්වා මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 09. ඩී.පී.පී. විශ්වජිත් ගංගා ප්‍රේමලාල් ගුරුගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 10. සුබෝධා ලක්ෂාණි රිබේරා මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - පක්ෂයි |
| 11. ඩබ්.එම්. උදය කුමාර බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 12. එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 13. පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 14. එස්. නිලාම් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 15. ඩී.පී. නිරෝෂා දිල්රුක්ෂිකා ජයසේකර මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - පක්ෂයි |
| 16. එස්.පී. සරත් කුමාර ලාල් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 17. රාජකුමාර් විදුෂණී මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - පක්ෂයි |
| 18. එන්.එම්. නන්දාවතී මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - පක්ෂයි |
| 19. ආර්.පී. පී. ඉෂංකා ලක්මාලි සෙනෙවිරත්න මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - පක්ෂයි |

2023 වර්ෂය සඳහා සැකසූ අයවැය කෙටුම්පතට විපක්ෂව ඡන්දය ලබා දීම ආරම්භ කරන්න. අත් ඔසවා ඡන්දය ප්‍රකාශ කරන්න.

| | | |
|---|---|---|
| 01.එම්.පී. අබේරත්න බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - විපක්ෂයි |

අද දින සභා වාරය සඳහා නොපැමිණි සභිකවරුः-

| | | |
|---|---|---|
| 01. ඒ.ඒ. අජිත් ප්‍රියන්ත බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පැමිණ නැත |
| 02.ආර්.එම්.චාමික අනුරාධ රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පැමිණ නැත |
| 03.එච්.පී. ආනන්ද කුලතිලක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පැමිණ නැත |

ගරු සභාපතිතුමා
ඡන්ද විමසීම අනුව 2023 වර්ෂයේ අයවැය සඳහා පක්ෂව ඡන්ද 19 ක්ද විපක්ෂව ඡන්ද 01 ක්ද ලබාගෙන ඇත.අද දින සභා වාරයට නොපැමිණි මන්ත්‍රීවරුන් සංඛ්‍යාව 03 කි.ඒ අනුව, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව මඟින් 2023 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද අයවැය කෙටුම්පත වැඩි ඡන්ද 18 කින් සභා සම්මත වූ බව මා ගරු මහා සභාවට ප්‍රකාශ කරනවා.

තීරණය
2023 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය කෙටුම්පත අනුමත කිරීම සුදුසු බවට තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව බහුතර ඡන්දයෙන් සභා සම්මත විය.

05:01:02:ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

ගම්පොළ පුද්ගලික බස් නැවතුම අසලින් ශ්‍රී චක්කින්දාරාම පුරාණ විහාරස්ථානය දෙසට ගමන් කරන මාර්ගය 1961 අගෝස්තු මස 25 වන දින අංක 10517 දරණ ගැසට් පත්‍රය මගින් " වීගුලුවත්ත කැටේ පිටවත්ත හරහා ස්ටේෂන් පාරට යන පාර " ලෙස ගැසට් කර ඇත.මෙම මාර්ගය "ශ්‍රී චක්කින්දාරාම පුරාණ විහාර මාවත " ලෙස නම් කර දෙන ලෙස ශ්‍රී චක්කින්දාරාම පුරාණ විහාරස්ථානයේ විහාරාධිපති පූජ්‍ය හතරබාගේ සමිත හිමියන් විසින් සභාව වෙත ඉල්ලීමක් කර ඇති අතර ඒ අනුව " වීගුලුවත්ත කැටේ පිටවත්ත හරහා ස්ටේෂන් පාරට යන පාර " ලෙස ගැසට් කර ඇති මෙම මාර්ගය "ශ්‍රී චක්කින්දාරාම පුරාණ විහාර මාවත " ලෙස නම් කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්. උදය කුමාර බණ්ඩාර මහතා

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කළ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

ගම්පොළ පුද්ගලික බස් නැවතුම අසලින් ශ්‍රී චක්කින්දාරාම පුරාණ විහාරස්ථානය දෙසට ගමන් කරන මාර්ගය "ශ්‍රී චක්කින්දාරාම පුරාණ විහාර මාවත" ලෙස නම් කර දෙන ලෙස ශ්‍රී චක්කින්දාරාම පුරාණ විහාරස්ථානයේ විහාරාධිපති පූජ්‍ය හතරබාගේ සමිත හිමියන් විසින් සභාව වෙත ඉල්ලීමක් කර ඇති අතර ඒ අනුව " විගුලුවත්ත කැටේ පිටවත්ත හරහා ස්ටේෂන් පාරට යන පාර " ලෙස ගැසට් කර ඇති මෙම මාර්ගය "ශ්‍රී චක්කින්දාරාම පුරාණ විහාර මාවත" ලෙස නම් කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.මේ සම්බන්ධයෙන් අදහස් ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්. උදය කුමාර බණ්ඩාර මහතා

ගරු සභාපතිතුමනි,මෙහි සඳහන් කර ඇත්තේ 1961 අගෝස්තු මස 25 වන දින අංක 10517 දරණ ගැසට් පත්‍රය මගින් " විගුලුවත්ත කැටේ පිටවත්ත හරහා ස්ටේෂන් පාරට යන පාර "වශයෙන් නම් කර ඇති බවයි.නමුත් එය ගරු ස්වාමින් වහන්සේට සිදු වු අත්වැරදීමක් විය හැකියි.මෙම මාර්ගය බස් නැවතුම්පොළේ සිට විගුලුවත්ත හරහා යන මාර්ගය ලෙස වෙනස්විය යුතුයි .එම විහාරස්ථානයෙහි දැනට වැඩවසන පූජ්‍ය හතරබාගේ සමිත හිමියන්ගෙන් සහ මෙම චක්කින්දාරාම විහාරස්ථානයෙන් බෞද්ධ ජනතාවට විශාල සේවාවක් ඉටුවෙන බැවින් මෙම මාර්ගය "ශ්‍රී චක්කින්දාරාම පුරාණ විහාර මාවත " ලෙස නම් කිරීම සුදුසු බව මාගේ අදහසයි.එසේම ප්‍රාදේශීය සභාවෙන් මෙම මාර්ගය නඩත්තු කිරීම ඉතා දුර්වල මට්ටමක පවතිනවා.ජාත්‍යන්තර පාසල් දෙකකට,ඇන්ඩෲස් විද්‍යාලය,පිනරාජ බාලිකා විද්‍යාලය සහ ටියුෂන් පන්ති සඳහා යන පාසල් සිසුන් මෙම මාර්ගය භාවිතා කරනවා.පාසල් අවසන් වන වේලාවන්හිදී මෙම මාර්ගය දෙපසින් ගමන් කිරීම සඳහා ඉඩක් නොමැතිවීම ද ගැටළුවක් වන බැවින් මෙම මාර්ගය සකස් කර දෙන ලෙස ද ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී. අබේරත්න බණ්ඩාර මහතා

ගරු සභාපතිතුමනි,මෙම මාර්ගය දෙපස ඇවිදින මංතීරු සකසා ගැනීම ඉතා සුදුසු බව මගේ අදහසයි.පෞද්ගලික බස් නැවතුම්පොළ දෙසින් විශාල වාහන ප්‍රමාණයක් ඇතුළු කෙරෙන බැවින් සභාවට හැකියාවක් ඇත්නම් මාර්ගය දෙපස ඉන්ටර්ලොක් ගල් අතුරා සකස් කරගත හැකියි.එසේම අනතුරක් සිදුවීමේ අවදානමක් තිබෙන නිසා රෝහල දෙසට කඳුරට කුඩ කර්මාන්ත ශාලාව අසලින් කාණුවක් සකස් කරදෙන ලෙස ගම්පොළ නගර සභාවට ඉල්ලීමක් කරන ලෙසත් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා

ගරු මන්ත්‍රීතුමනි,එම අදහස ඉතාම අගය කරනවා.අපි මින් පෙර මෙම මාර්ගය සඳහා ලක්ෂ දෙකහමාරක් ප්‍රතිපාදන වෙන්කර ABC අතුරා මාර්ගය සකස් කිරීමට යෝජනා කර තිබුණු නමුත් එය සිදුවුයේ නැහැ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.ගුණරත්න මහතා

විගුලුවත්ත ක්‍රීඩාපිටිය පිහිටා ඇත්තේ ගම්පොළවෙල හා මාලිගාපුරණ වසම් අතරයි .නමුත් මෙම වසම් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට අයත් වන නමුත් විගුලුවත්ත ක්‍රීඩාපිටිය අයත් වන්නේ ගම්පොළ නගර සභාවටයි. ඒ සම්බන්ධව සීමා නීර්ණය කිරීමේ ගැටළු පවතිනවා. මාගේ පෞද්ගලික මතය නම් පාපන්දු සඳහා ප්‍රසිද්ධ විගුලුවත්ත ක්‍රීඩාපිටිය ආශ්‍රිත මෙම මාර්ගය චක්කින්දාරාම මාවත ලෙස නම් කිරීමෙන් එහි පෞරාණිකභාවයට හානියක් සිදුවන බවයි. විගුලුවත්ත ගම්පොළ රාජධානිය සමග බැඳුණු දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන ඉතාම රමණීය ඓතිහාසික ප්‍රදේශයක් වන බැවින් මෙම නාමය වෙනස් කිරීම සම්බන්ධව නැවත සළකා බැලිය යුතුය යන්න මගේ අදහසයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.ඩබ්. පතිරණ මහතා

ගරු සභාපතිතුමනි ,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.ගුණරත්න මහතා ඉදිරිපත් කළ අදහසට මමත් එකඟත්වය ප්‍රකාශ කරනවා. මේ සම්බන්ධව නැවත සළකා බැලිය යුතුය යන්න මගේ ද අදහසයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී. සරත් කුමාර ලාල් මහතා

ගරු සභාපතිතුමනි, ඓතිහාසික නමක් වෙනස් කිරීම සුදුසු නැත යන්න මගේ ද අදහසයි .එම නිසා මේ සම්බන්ධව සළකා බැලිය යුතුයි.

ගරු සභාපතිතුමා

එසේ නම් මේ සම්බන්ධයෙන් උපදේශක කාරක සභාව සමඟ සාකච්ඡා කර තීරණයක් ගැනීම වඩාත් සුදුසුයි.

තීරණය

මාර්ගය නැවත නම් කිරීම සම්බන්ධයෙන් උපදේශක කාරක සභාව සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි.

05:01:03:ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු පැරණි ප්‍රාදේශීය සභා භූමියේ ඉදිකිරීමට යෝජිත නව වෙළඳ සංකීර්ණයේ ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව ගොඩනැගිල්ලෙහි පළමු මහළ ලංකා බැංකුව සහ කාර්ගිල්ස් ෆුඩ් කම්පැණි වෙත දීර්ඝකාලීන බදු පදනම මත බදු දීමට අදාළව 2022-06-29 වන දිනැති සංශෝධිත සැළැස්ම අනුව පහළ මහලේ වාහන අංගනය ඉදිකෙරෙන කොටසේ කාර්ගිල්ස් ෆුඩ් ආයතනයේ ගබඩාව ඉදිකිරීම සුදුසු බවටත් පළමු මහලේ වාණිජ කටයුතු සඳහා වර්ග අඩි 3698ක ප්‍රමාණයත් සමග මුළු වර්ග අඩි 6587ක ප්‍රමාණයක් කාර්ගිලිස් ෆුඩ් කම්පැණි ආයතනය වෙත දීර්ඝකාලීන බදු පදනම මත ලබාදීම සුදුසු බවටත් කුරුඳුවත්ත ලංකා බැංකු ශාඛාව සඳහා පළමු මහලේ වර්ග අඩි 1620ක් සමග මුළු වර්ග අඩි 3297ක ප්‍රමාණයක් දීර්ඝ කාලීන බදු පදනම මත ලබාදීම සුදුසු බවටත් ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.සුමේධ  අලුත්ගමගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු පැරණි ප්‍රාදේශීය සභා භූමියේ ඉදිකිරීමට යෝජිත නව වෙළඳ සංකීර්ණයේ පළමු මහළ ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව ලංකා බැංකුව සහ කාර්ගිල්ස් ෆුඩ් කම්පැණි වෙත දීර්ඝකාලීන බදු පදනම මත බදු දීමට ගරු මහා සභාව තීරණය කරන ලද අතර  2022-06-29වන දිනැති සංශෝධිත සැළැස්ම අනුව පහළ මහලේ වාහන අංගනය ඉදිකෙරෙන කොටසේ කාර්ගිල්ස් ෆුඩ් ආයතනයේ ගබඩාව ඉදිකිරීමට සහ පළමු මහලේ වාණිජ කටයුතු සඳහා වර්ග අඩි 3698ක ප්‍රමාණයත් සමග මුළු වර්ග අඩි 6587ක ප්‍රමාණයක් කාර්ගිලිස් ෆුඩ් කම්පැණි ආයතනය වෙත දීර්ඝකාලීන බදු පදනම මත ලබාදීමටත් කුරුඳුවත්ත ලංකා බැංකු ශාඛාව සඳහා පළමු මහලේ වර්ග අඩි 1620ක් සමග මුළු වර්ග අඩි 3297ක ප්‍රමාණයක් දීර්ඝ කාලීන බදු පදනම මත ලබාදීම සුදුසු බවටත් ගරු මහා සභාවට යෝජනා කරනවා.මම කාර්ගිලිස් ෆුඩ් කම්පැණි සමගත් ලංකා බැංකුවේ සභාපතිතුමා සමගත් මේ සම්බන්ධව සාකච්ඡා කරනු ලැබුවා කාර්ගිලිස් ෆුඩ් කම්පැනියෙන්  ලක්ෂ නවයකට වැඩි මුදලක් සහ ලංකා බැංකුවෙන් ලක්ෂ තුනකට ආසන්න මුදලක් මාසිකවකුලී මුදල් ලබාගත හැකිවන අතර මේ සඳහා අප ලබා ගන්නා දේශීය ණය මුදල් සඳහා මාසිකව ගෙවිය යුතු වාරිකය වන රුපියල් ලක්ෂ නවයක මුදල මෙමගින් පියවා ගත හැකියි.එසේ ම විශේෂයෙන් හිටපු සභාපතිවරුන් දෙදෙනාගෙන් මේ සම්බන්ධයෙන් මට උපදෙස් ලබාදෙන ලෙස මම ඉල්ලා සිටිනවා. ප්‍රථමයෙන් අපට කෝටි තුනක් ලබාගත හැකිවන නමුත් මෙම ආයතනවලින් අපට අයවිය යුතු කුළී ගෙවෙන්නේ මින් වසර තුනකට පසුවයි. මේ සඳහා සභා අනුමැතිය ලබාගෙන කාර්ගිලිස් ෆුඩ් කම්පැණිහි විධායක නිලධාරීන් හමුවිය යුතුයි.මේ සම්බන්ධයෙන් වෙනත් අදහස් ඇත්නම්  ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති  ඒ. මහින්දරත්න අලුත්ගමගේ මහතා

අදාළ ආයතන සමග සාකච්ඡා කර සුදුසු තීරණයකට එළැඹෙමු. එම නිසා මෙම යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බව මගේ අදහසයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.ගුණරත්න මහතා

ගරු සභාපතිතුමනි මෙම  භූමිය කුරුඳුවත්ත නගරයේ තිබෙන වෙළඳපොළ වටිනාකම ඉතා ඉහළ තත්ත්වයක පවතින වටිනා භූමියක් වන අතර  මෙම අදාළ ආයතන සමග සාකච්ඡා කර එළැඹෙන එකඟතාවය කෙටුම්පතක් වශයෙන්  ගරු මහා සභාවට ඉදිරිපත් කර  ඉන් පසු එහි අඩුපාඩු ඇත්නම් නිවැරදි කරගෙන ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම සුදුසුයි.

ගරු සභාපතිතුමා

මෙලෙස ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව දීර්ඝකාලීන බදු ලබා දීම සඳහා  පළාත් පාලන සහකාර කොමසාරිස් හරහා පළාත් පාලන කොමසාරිස් වෙත ඉදිරිපත් කෙරෙනවා. පළාත් පාලන කොමසාරිස්තුමා හරහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට ඉදිරිපත් කෙරෙනවා .ඉන්පසු ගරු ආණ්ඩුකාරතුමා විසින් මේ සඳහා අනුමැතිය ලබාදීම සම්බන්ධව තීරණය කරනු ලබනවා. ආණ්ඩුකාරතුමා විසින් මේ සඳහා අනුමැතිය ලබාදෙන්නේ නම් නිත්‍යානුකූලව මේ සම්බන්ධයෙන් කිසිදු ගැටළුවක් ඇතිවන්නේ නැහැ .

තීරණය

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු පැරණි ප්‍රාදේශීය සභා භූමියේ ඉදිකිරීමට යෝජිත නව වෙළඳ සංකීර්ණයේ ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව ,ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව ගොඩනැගිල්ලෙහි පළමු මහළ ලංකා බැංකුව සහ කාර්ගිල්ස් ෆුඩ් කම්පැණි වෙත දීර්ඝකාලීන බදු පදනම මත බදු දීමට අදාළව 2022-06-29 වන දිනැති සංශෝධිත සැළැස්ම අනුව පහළ මහලේ වාහන අංගනය ඉදිකෙරෙන කොටසේ කාර්ගිල්ස් ෆුඩ් ආයතනයේ ගබඩාව ඉදිකිරීම සුදුසු බවටත් පළමු මහලේ වාණිජ කටයුතු සඳහා වර්ග අඩි 3698ක ප්‍රමාණයත් සමග මුළු වර්ග අඩි 6587ක ප්‍රමාණයක් කාර්ගිලිස් ෆුඩ් කම්පැණි ආයතනය වෙත දීර්ඝකාලීන බදු පදනම මත ලබාදීම සුදුසු බවටත් කුරුඳුවත්ත ලංකා බැංකු ශාඛාව සඳහා පළමු මහලේ වර්ග අඩි 1620ක් සමග මුළු වර්ග අඩි 3297ක ප්‍රමාණයක් දීර්ඝ කාලීන බදු පදනම මත ලබාදීම සුදුසු බවට තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:04:ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

2022 වර්ෂයේ සභා අරමුදල් ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත මල්වත්තගම උදාකළ ගම්මානයේ ඉදිකරන ලද බුදුමැදුර ප්‍රතිසංස්කරණය කිරීමට විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

2022 වර්ෂයේ සභා අරමුදල් ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත මල්වත්තගම උදාකළ ගම්මානයේ ඉදිකරන ලද බුදුමැදුර ප්‍රතිසංස්කරණය කිරීමට විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා මේ පිළිබඳව ගරු මහා සභාවේ අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි

ගරු සභාපතිතුමනි ආණ්ඩුකාරතුමා හරහා අනුමැතිය ලැබීමට විශාල කාලයක් ගතවෙනවා. මෙම ව්‍යාපෘතිය සඳහා ඉක්මණින් අනුමැතිය ලබාගත හැකිනම් එය වඩා සුදුසුයි.

ගරු සභාපතිතුමා

ගරු ස්වාමීන් වහන්ස, කොවිඩ් ගැටලු සමග පසුගිය කාලයේ අනුමැතිය ලැබීමට කල්ගතවුවත් දැන් දීර්ඝ කාලයක් ගතවන්නේ නැහැ. මේ සම්බන්ධව වෙනත් අදහස් ඉදිරිපත් නොවන බව පෙනී යනවා.

තීරණය

2022 වර්ෂයේ සභා අරමුදල් ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත මල්වත්තගම උදාකළ ගම්මානයේ ඉදිකරන ලද බුදුමැදුර ප්‍රතිසංස්කරණය කිරීමට විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:05:ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

2022 වර්ෂයේ සභා අරමුදල් මගින් ක්‍රියාත්මක කරන ලද බෝගොල්ල සම්පත් මහතාගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කිරීම ව්‍යාපෘතිය සඳහා රු.750,000.00ක මුදලක් උලපනේවත්ත සමගි ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.සුමේධ අලුත්ගමගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

2022 වර්ෂයේ සභා අරමුදල් මගින් ක්‍රියාත්මක කරන ලද බෝගොල්ල සම්පත් මහතාගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කිරීම ව්‍යාපෘතිය සඳහා රු.750,000.00ක මුදලක් උලපනේවත්ත සමගි ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.මේ පිළිබඳව ගරු මහා සභාවේ අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙනවා.

ගරු සභාපතිතුමා

මේ සම්බන්ධව වෙනත් අදහස් ඉදිරිපත් නොවන බව පෙනී යනවා.

තීරණය

2022 වර්ෂයේ සභා අරමුදල් මගින් ක්‍රියාත්මක කරන ලද බෝගොල්ල සම්පත් මහතාගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කිරීම ව්‍යාපෘතිය සඳහා රු.750,000.00ක මුදලක් උලපනේවත්ත සමගි ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:06:ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

2022 වර්ෂයේ සභා අරමුදල් මගින් ක්‍රියාත්මක කරන ලද බෝගොල්ල සම්පත් මහතාගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කිරීම ව්‍යාපෘතිය සඳහා රු.750,000.00ක මුදලක් උලපනේවත්ත සමගි ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුබෝධා ලක්ෂාණි රිබේරා මහත්මිය

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

2021 වර්ෂයේ ණයගිම් කර ඇති සභා අරමුදල් ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලද වල්ලහගොඩ කහටගස්තැන්න මාර්ගය සංවර්ධන කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.1,244,740.30ක මුදලක් ඇත්ගාල බටහිර - රන්කෙත ගොවි සංවිධානය වෙත ගෙවීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.මේ පිළිබඳව ගරු මහා සභාවේ අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙනවා.

ගරු සභාපතිතුමා

මේ සම්බන්ධව වෙනත් අදහස් ඉදිරිපත් නොවන බව පෙනී යනවා.

තීරණය

2021 වර්ෂයේ ණයගිම් කර ඇති සභා අරමුදල් ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලද වල්ලහගොඩ කහටගස්තැන්න මාර්ගය සංවර්ධන කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.1,244,740.30ක මුදලක් ඇත්ගාල බටහිර - රන්කෙත ගොවි සංවිධානය වෙත ගෙවීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

06. යථාපරිදි කල්දී නොමැති යෝජනා /හදිසියෝජනා - ඇත

06:01 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම ව්‍යාපෘතිය - අදියර 01 සඳහා 2021-12-14 වන දින තීරණ අංක 06:03 යටතේ රු.94,000,000.00ක ඇස්තමේන්තු මුදලකට සහ සැලැස්ම සඳහා ගරු මහා සභා අනුමැතිය ලබාගෙන ඇත.නමුත් අමුද්‍රව්‍යවල හා වෙනත් සේවාවන්හි වෙළඳපොළ මිළ ඉහළ යාම හේතුවෙන් පෙර ඇස්තමේන්තු මුදල ඉක්මවා එකතු කළ අගය මත බද්ද 15%ක් ,භෞතික වෙනස්වීම් සඳහා 10% දක්වා ද මිළ විචලනයන් සඳහා 5%ක් ද උපදේශන සේවා ගාස්තු සඳහා 3.5 %ක් ද ඇතුළත්ව තවත් රුපියල් මිලියන 27.7 ක මුදලක් වැයවෙතැයි

ඇස්තමේන්තුගත කර ඇත.ඒ අනුව සංශෝධිත ඇස්තමේන්තු මුදල වන රු.121,700,000.00 ක් සහ සංශෝධිත සැලැස්ම සඳහා ගරු මහා සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම ව්‍යාපෘතිය - අදියර 01 සඳහා 2021-12-14 වන දින තීරණ අංක 06:03 යටතේ රු.94,000,000.00ක ඇස්තමේන්තු මුදලකට සහ සැලැස්ම සඳහා ගරු මහා සභා අනුමැතිය ලබාගෙන ඇත.නමුත් අමුද්‍රව්‍යවල හා වෙනත් සේවාවන්හි වෙළඳපොළ මිළ ඉහළ යාම හේතුවෙන් එකතු කළ අගය මත බද්ද 15%ක් ,භෞතික වෙනස්වීම් සඳහා 10% දක්වා ද මිළ විචලනයන් සඳහා 5%ක් ද උපදේශන සේවා ගාස්තු සඳහා 3.5 % ද ඇතුළත්ව තවත් රුපියල් මිලියන 27.7 ක මුදලක් වැයවෙතැයි ඇස්තමේන්තුගත කර ඇත.ඒ අනුව සංශෝධිත ඇස්තමේන්තු මුදල වන රු.121,700,000.00 ක් සහ සංශෝධිත සැලැස්ම සඳහා ගරු මහා සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව විසින් සම්පූර්ණ අධීක්ෂණ කටයුතු සිදුකෙරෙනවා. ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව යම් ගෙවීමක් කිරීමට නිර්දේශ කළහොත් පමණක් අපට එම මුදල් ගෙවීමට සිදුවෙනවා. මේ පිළිබඳව වෙනත් අදහස් ඇත්නම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා

ගරු සභාපතිතුමනි,ඔබතුමාගේ ධුරකාලය අවසාන භාගයේ ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය කඩිනමින් අවසන් කළ යුතුයි.නමුත් රුපියල් කෝටි නවයක් ලෙස පැවති ඇස්තමේන්තුව දැන් රුපියල් කෝටි දහතුනක් දක්වා ඉහළ ගොස් තිබෙනවා. ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කළ අසුපිණි ඇල්ල සංවර්ධන ව්‍යාපෘතිය ලක්ෂ අනූහතරකට ඇස්තමේන්තු කර තිබුනත් සංශෝධිත ඇස්තමේන්තුවෙන් ලක්ෂ දහතුනක් ගෙවිය යුතු වුවත් ලක්ෂ දෙකකින් පමණක් ඇස්තමේන්තුව සංශෝධනය වී තිබෙනවා.නමුත් මෙම ව්‍යාපෘතියේදී රුපියල් කෝටි නවයක ඇස්තමේන්තුව රුපියල් කෝටි තුනකින් වැඩිකර තිබෙනවා. .මෙම ඇස්තමේන්තුව සංශෝධනය කරන අවස්ථාව වන විට කම්බි ටොන් එකක් රුපියල් පන්ලක්ෂ අසූඅට දහසක් පමණ වුවත් මේ වන විට කම්බි ටොන් එකක් රුපියල් එක්ලක්ෂ අසූ අට දහසකින් පමණ අඩු වී ඇති අතර මේ කාලයේදී භාණ්ඩ මිළ නැවත අඩුවෙමින් පවතිනවා.එම නිසා මේ සම්බන්ධව අපට පැහැදිලි කිරීමක් අවශ්‍යයි. එසේම යම් අපහසුතාවයකදී ප්‍රයෝජනවත් විය හැකි බැවින් මේ ව්‍යාපෘතිය සඳහා අපේ ප්‍රාදේශීය සභාවෙන් තාක්ෂණ නිලධාරීන් දෙදෙනෙක් සම්බන්ධ කිරීම සුදුසු බව මගේ අදහසයි.

ගරු සභාපතිතුමා

මෙම සංශෝධිත ඇස්තමේන්තුව යොමු කරලා තියෙන්නේ මේ ඇස්තමේන්තුවට යටත්ව යම් ගෙවීමක් සිදුකරන ලෙස ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව නිර්දේශ කළ විට පමණක් ගෙවීම් කිරීම සඳහා පමණයි.මේ සම්බන්ධව සියලු අධීක්ෂණ කටයුතු ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව සිදුකරනවා. ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව විසින් යම් ගෙවීමක් සිදුකරන ලෙස නිර්දේශ කළොත් එම ගෙවීම් සිදුකළ යුතුයි.එසේම අප ප්‍රාදේශීය සභාවේ තාක්ෂණ නිලධාරී මහතෙක් මෙම ව්‍යාපෘතියට සම්බන්ධ කර තිබෙනවා.මේ සම්බන්ධව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව හා විරුද්ධත්වයක් නොමැති බව පෙනීයනවා.

තීරණය

කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම ව්‍යාපෘතිය - අදියර 01 සඳහා අමුද්‍රව්‍යවල හා වෙනත් සේවාවන්හි වෙළඳපොළ මිළ ඉහළ යාම හේතුවෙන් පෙර ඇස්තමේන්තු මුදල ඉක්මවා එකතු කළ අගය මත බද්ද 15%ක් ,භෞතික වෙනස්වීම් සඳහා 10% දක්වා ද මිළ විචලනයන් සඳහා 5%ක් ද උපදේශන සේවා ගාස්තු සඳහා 3.5 % ද ඇතුළත්ව තවත් රුපියල් මිලියන 27.7 ක මුදලක් වැයවෙතැයි ඇස්තමේන්තුගත කර ඇති බැවින් සංශෝධිත ඇස්තමේන්තු මුදල වන රු.121,700,000.00 ක් සහ සංශෝධිත සැලැස්ම සඳහා ගරු මහා සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

06:02 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව මගින් යොමු කරන ලද ලිපියක් මගින් ඇත්ගාල වෙළඳ සංකීර්ණයෙහි අංක 21 දරණ කඩ කාමරය එම ආයතනයේ ප්‍රාදේශීය කාර්යාලයක් පවත්වාගෙන යාම සඳහා බදු පදනමින් ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇත. දැනට එහි කුඩා තේවතු සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාලය පවත්වාගෙන යනු ලබන අතර එම කාර්යාලය එම ස්ථානයෙන් ඉවත්කර ගන්නා බව දැනුම් දී ඇත.ඒ අනුව ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලයක් පවත්වා ගෙන යාම සඳහා ඇත්ගාල වෙළඳ

සංකීර්ණයෙහි අංක 21 දරණ කඩ කාමරය ගරු විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියට යටත්ව විවෘත ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව ,රජයේ නව තක්සේරුවකට යටත්ව වසර 03ක කාලසීමාවක් සඳහා බදු පදනමින් ලබාදීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්. උදය කුමාර බණ්ඩාර මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව මගින් යොමු කරන ලද ලිපියක් මගින් ඇත්ගාල වෙළඳ සංකීර්ණයෙහි අංක 21 දරණ කඩ කාමරය එම ආයතනයේ ප්‍රාදේශීය කාර්යාලයක් පවත්වාගෙන යාම සඳහා බදු පදනමින් ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇත. දැනට එහි කුඩා තේවතු සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාලය පවත්වාගෙන යනු ලබන අතර එම කාර්යාලය සඳහා රු.10500.00ක මුදලක් මාසිකව ගෙවනු ලබනවා. එම කාර්යාලය පවත්වාගෙන යාම සඳහා ජංගම පොලිස් මුරපොළ පැවති ස්ථානය ප්‍රමාණවත් බවත් දැනුම් දී ඇත.ඒ අනුව ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලයක් පවත්වා ගෙන යාම සඳහා ඇත්ගාල වෙළඳ සංකීර්ණයෙහි අංක 21 දරණ කඩ කාමරය ගරු විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියට යටත්ව විවෘත ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව ,රජයේ නව තක්සේරුවකට යටත්ව වසර 03ක කාලසීමාවක් සඳහා බදු පදනමින් ලබාදීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා

ගරු සභාපතිතුමනි මෙම කඩ කාමරය බදු දෙන්නේ ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව නිසා ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය කඩිනමින් ලබාගැනීම සුදුසුයි.

ගරු සභාපතිතුමා

කුඩා තේවතු සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාලය මෙම කඩ කාමරයෙන් ඉවත් වූ පසු ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලය සඳහා මෙය ලබාදිය හැකියි. එහි සේවකයින් 20ක් පමණ සේවය කරන අතර දිනකට සේවාලාභීන් 50ක් පමණ සේවා ලබාගැනිමට පැමිණිය හැකියි . තක්සේරුවට අනුව රු. 12000. 00ක මුදලක් අය කළ හැකියි. වසර තුනක කාලය අවසන් නම් නැවත තක්සේරු කර මෙම කඩ කාමරය බදු පදනමින් ලබාදීමට හැකියාව තිබෙනවා. මේ සම්බන්ධයෙන් වෙනත් අදහස් ඉදිරිපත් නොවන බව පෙනී යනවා.

තීරණය

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව මගින් යොමු කරන ලද ලිපියක් මගින් ඇත්ගාල වෙළඳ සංකීර්ණයෙහි අංක 21 දරණ කඩ කාමරය එම ආයතනයේ ප්‍රාදේශීය කාර්යාලයක් පවත්වාගෙන යාම සඳහා බදු පදනමින් ලබා දෙන ලෙස ඉල්ලීම අනුව ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලයක් පවත්වා ගෙන යාම සඳහා ඇත්ගාල වෙළඳ සංකීර්ණයෙහි අංක 21 දරණ කඩ කාමරය ගරු විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියට යටත්ව විවෘත ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව ,රජයේ නව තක්සේරුවකට යටත්ව වසර 03ක කාලසීමාවක් සඳහා බදු පදනමින් ලබාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

06:03 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

2022 අයවැය ප්‍රතිපාදන මගින් වෙන්කර ඇති රු.700,000.00ක මුදලින් කුරුඳුවත්ත,ඇත්ගාල හා උලපනේ පුස්තකාල සඳහා පොත් මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ජී.සුමේධ අලුත්ගමගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

2022 අයවැය ප්‍රතිපාදන මගින් වෙන්කර ඇති රු.700,000.00ක මුදලින් කුරුඳුවත්ත,ඇත්ගාල හා උලපනේ පුස්තකාල සඳහා පොත් මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා

කරනවා.කෙලිගෘප් පුස්තකාලය දෙසැම්බර් වන විට ආරම්භ කළ යුතුයි. ගරු නාලක මන්ත්‍රීතුමනි උඩහේන්තැන්න පුස්තකාලය සඳහා සුදුසු ස්ථානයක් සූදානම් කරගත හැකිනම් නව ගොඩනැගිල්ල සාදන තෙක් එම ස්ථානයේ පුස්තකාලය පවත්වාගෙන යාහැකි බැවින් ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා

වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව පෙනී යනවා.

තීරණය

2022 අයවැය ප්‍රතිපාදන මගින් වෙන්කර ඇති රු.700,000.00ක මුදලින් කුරුඳුවත්ත,ඇත්ගාල හා උලපනේ පුස්තකාල සඳහා පොත් මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය තිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

06:04 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

දැනට ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල සීමාව තුල වරිපනම් බදු අය කිරීමට සිදුවන ප්‍රදේශ සහ ඉදිරියේ දී වරිපනම් බදු අය කිරීම සඳහා දැනට ගැසට් කර ඇති බල ප්‍රදේශවලට අයත් නොවන, විශේෂ දේපල ලෙස හඳුනාගත් පහත දේපල සඳහා වරිපනම් බදු පැනවීමේ කාර්යය වෙනුවෙන් විශේෂ දේපල ලෙස ප්‍රකාශයට පත් කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

01. තේ කර්මාන්ත ශාලා -

- පල්ලේගම තේ කර්මාන්ත ශාලාව - උලපනේ
- රජඇල තේ කර්මාන්ත ශාලාව - උලපනේ
- Fernland තේ කර්මාන්ත ශාලාව - උලපනේ
- අපර් ලැන්ටන්හිල් කර්මාන්ත ශාලාව - වැලිකන්ද
- ක්‍රේහේඩ් කර්මාන්ත ශාලාව - මේරිවිල හන්දිය
- පරගල තේ කර්මාන්ත ශාලාව - පරගල
- බරණගල තේ කර්මාන්ත ශාලාව - රාක්ෂාව
- රාක්ෂාව තේ කර්මාන්ත ශාලාව - රාක්ෂාව
- මොන්ටික්‍රිස්ටෝ තේ කර්මාන්ත ශාලාව - මේරිවිල
- මොස්විල් තේ කර්මාන්ත ශාලාව - දොළොස්බාගේ
- ඉගුරුගලවත්ත තේ කර්මාන්ත ශාලාව - බෙරවිල
- මල්ගොල්ල තේ කර්මාන්ත ශාලාව - පටිතලාව
- මැදගොඩ තේ කර්මාන්ත ශාලාව - වැටකේදෙණිය
- කොලිගෘප් තේ කර්මාන්ත ශාලාව - කෙලිගෘප්
- කුරුඳුවත්ත තේ කර්මාන්ත ශාලාව
- ගල්පාය තේ කර්මාන්ත ශාලාව

02. හොටෙල්

- ඇක්වා දුන්හිඳ - ඇත්ගාල
- විලා රිවරිනා - උලපනේ
- රිවරිනා හොලිඩේ රිසෝට් - උලපනේ
- ද වියර් හවුස් - උලපනේ

- ක්ලිෆ්ටන් මැනර් - කුරුදුවත්ත
- ක්‍රිස්බෝ බංගලෝ - පරගල

03. ලී මෝල්

- උඩරට ලී මෝල - උලපනේ
- නන්දන ලී මෝල - ගල්පාය

04. කුකුළු ගොවිපොල

- ක්‍රිස්බෝ ෆාම් - පරගල
- ක්‍රිස්බෝ ෆාම් - කෙලිගෲප්
- සියනෑ ෆාම් - දොළොස්බාගේ
- ක්‍රිස්බෝ ෆාම් - ඇත්ගාල

05. කර්මාන්තපුරය - උලපනේ

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය පට්ටිපොළ සුමනරතන හිමි

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කළ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

දැනට ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල සීමාව තුල වරිපනම් බදු අය කිරීමට සිදුවන ප්‍රදේශ සහ ඉදිරියේ දී වරිපනම් බදු අය කිරීම සඳහා දැනට ගැසට් කර ඇති බල ප්‍රදේශවලට අයත් නොවන, විශේෂ දේපල ලෙස හදුනාගත් ඉහත සඳහන් දේපල සඳහා වරිපනම් බදු පැනවීමේ කාර්යය වෙනුවෙන් විශේෂ දේපල ලෙස ප්‍රකාශයට පත් කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා හැකි ඉක්මණින් එම කාර්යය සිදුකර ගැනීමටත් කටයුතු කරන බව දැනුම් දෙනවා

තීරණය

දැනට ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල සීමාව තුල වරිපනම් බදු අය කිරීමට සිදුවන ප්‍රදේශ සහ ඉදිරියේ දී වරිපනම් බදු අය කිරීම සඳහා දැනට ගැසට් කර ඇති බල ප්‍රදේශවලට අයත් නොවන, විශේෂ දේපල ලෙස හදුනාගත් ඉහත සඳහන් කළ දේපල සඳහා වරිපනම් බදු පැනවීමේ කාර්යය වෙනුවෙන් විශේෂ දේපල ලෙස ප්‍රකාශයට පත් කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 07 කාරක සභා වාර්තා සළකා බැලීම

### 07:01 මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව

2022.10.09 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව සභා ගත කරන ලදි. ඒ අනුව 2022 වර්ෂයට අදාළ ආදායම් වියදම් පුරෝකථනයද, 2022 සැප්තැම්බර් මස මුළු ලැබීම් රුː13,555,481.74ක් ද මුළු වියදම රුː 7,411,598.78ක්ද විය. 2022 සැප්තැම්බර් මසට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශය 2022.10.08 වන දින මහනුවර විගණන අධිකාරි වෙත යොමුකර ඇත.

## 08.සභාවේ මාසික ලැබීම් හා ගෙවීම් වාර්තාව

**2022.10.10** සිට 2022.10.14 දක්වා ගෙවීම් වාර්තාව සභාගත කරන ලදි.

| අනු | දිනය | ආදයකයා | ගෙවීම් විස්තරය | වවුව | හරස් | මුදල |
|---|---|---|---|---|---|---|

| අංකය | | | | ඊ අංකය | සටහන් | |
|---|---|---|---|---|---|---|
| 1 | 2022-10-10 | උලපනේවත්ත සමගි ග්‍රාම සංවර්ධන -සුභ සාධක සමිතිය | 2022 වර්ෂයේ සභා අරමුදල් මගින් ක්‍රියාත්මක කරන ලද බෝගොල්ල සම්පත් මහතාගේ නිවස අසළ මාර්ගය සංවර්ධනය කිරිම ව්‍යාපෘතියේ මුදල් ගෙවීම. | 1117 | 86,475.00 | 663,525.00 |
| 2 | | උලපනේවත්ත සමගි ග්‍රාම සංවර්ධන -සුභ සාධක සමිතිය | 2022 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද උලපනේවත්ත ජල යෝජනා ව්‍යාපෘතියේ 1 වන අදියර යටතේ එලන ලද ජල නල පද්ධතිය ලං.වි.ම කණු සිටුවීම ව්‍යාපෘතිය නිසා බිද වැටීම හේතුවෙන් නැවත අළුත්වැඩියා කිරිම ව්‍යාපෘතියේ අතරැදි මුදල් ගෙවීම. | 1118 | 25.00 | 57,013.00 |
| 3 | | තරිදු ඩිජිටල් ඇන්ඩ් ඇඩ්වර්ටයිසින් .නො. 232, අඹගමුව පාර,ගම්පොළ. | ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඔලියාවල සිට බරන්දරේ කැන්දගොල්ල මාර්ගයට දැන්වීම් පුවරුවක් සාදා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1119 | | 17,700.00 |
| 4 | | N.U.G.A.S. විමලරත්න අංක 01 කුරුදුවත්ත කඩවීදිය. | ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ දොළොස්බාගේ නගරයේ මහජන වැසිකිළියේ ජල නළ පද්ධතිය අළුත්වැඩියා කිරීමේ ගාස්තු ගෙවීම. | 1120 | | 400.00 |
| 5 | | සුරන්ජන් විජයන් මයා. මල්වත්තගම,කුරුදුවත්ත කඩ විදිය. | ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ව්‍යාපෘතියක් වූ අසුපිණි ඇල්ල පැරණි නැරඹුම් මැදිරියේ ඉවත් කරන ලද සිමෙන්ති කණු 17 ක් රැගෙන ඒම වෙනුවෙන් ප්‍රවාහන වියදම් ගෙවීම. | 1121 | | 3,500.00 |
| 6 | | T.M කරුණාරත්න - නව ලහිරු මුද්‍රණාලය, අංක 01, දුම්රිය පොළ පාර, ගම්පොළ. | ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ දින මුද්‍රාව,කම්ටු මුද්‍රාව,ප්‍රධාන කලමණාකරණ සේවා නිලධාරි මුද්‍රාව,කාර්ය භාර නිලධාරි මුද්‍රාව අක්‍රීය බැවින් නැවත නව මුද්‍රා සෑදීම වෙනුවෙන් ගෙවීම. | 1122 | | 8,000.00 |
| 7 | | පී.පී.එස්.ජේ කිත්සිරි මයා පරිසර නිලධාරී ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව. | 2022.10.07 දින කුරුදුවත්ත ලිට්ල් රෝස් පෙරපාසලෙහි කසළ කලමණාකරණය හා ඩෙංගු පාලනය පිළිබඳව පැවැත්වූ වැඩසටහන සඳහා ළමයින් වෙනුවෙන් සංග්‍රහ කිරීම සඳහා ලබා ගත් අත්තිකාරම් පියවීම. | 1123 | | 4,138.00 |
| 8 | | උලපනේවත්ත සමගි ග්‍රාම සංවර්ධන -සුභ සාධක සමිතිය - උලපනේ වත්ත,උලපනේ. | 2022 වර්ෂයේ ගම සමග පිළිසඳරක් වැඩසටහන මගින් ක්‍රියාත්මක කරන ලද බිලූ ෆීල්ඩ් පිටහ කුඹුර මාර්ගය සංවර්ධනය කිරිම ව්‍යාපෘතියේ මුදල් ගෙවීම. | 1124 | 4,202.82 | 254,318.82 |
| 9 | | උඩගම පරාක්‍රම ගොවි සංවිධානය, උඩගම,උලපනේ. | 2022 වර්ෂයේ ගම සමග පිළිසඳරක් වැඩසටහන මගින් ක්‍රියාත්මක කරන ලද නැට්සා හඳබිම ජයන්ත මහතාගේ නිවස සිට පර්සි මහතාගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කිරිම ව්‍යාපෘතියේ මුදල් ගෙවීම. | 1125 | 5,562.62 | 343,612.38 |
| 10 | 2022-10-11 | ගැමුණු ගොවි සංවිධානය - උලපනේ. | 2022 වර්ෂයේ ගම සමග පිළිසඳරක් වැඩසටහන මගින් ක්‍රියාත්මක කරන ලද ජාතික තරුණ සේවා මධ්‍යස්ථානයට යන මාර්ගය සංවර්ධනය කිරිම ව්‍යාපෘතියේ මුදල් ගෙවීම. | 1126 | 5,562.62 | 343,612.38 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 11 | 2022-10-12 | ගරු සභාපති , ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව | 2022.10.05 වන දින පළාත් පාලනය සහ නායකත්වය පිළිබඳ ජාත්‍යන්තර සමුළුවට සහභාගී වීම නිමිත්තෙන් සහභාගිත්ව වියදම සහ නවාතැන් පහසුකම් වියදම ගෙවීම. | 1127 | | 12,750.00 |
| 12 | | ලේකම් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව | 2022.10.24 දින උඩහේන්තැන්න වැඩිහිටි නිවාසයේ වැඩිහිටියන් නෙල්ලිගල බෞද්ධ මධ්‍යස්ථානය වෙත රැගෙන යාමේ වැඩසටහනක් තරු කවය මගින් සංවිධානය කර ඇත.ඊට ආධාර පිණිස කුරුදුවත්ත තේ කම්හල ලබා දුන් ආධාර මුදල ලබා ගැනීම. | 1128 | | 10,000.00 |
| 13 | | ඩබ්.ඩී.එන්.ඩී.එල්. වික්‍රමසිංහ මිය. සංවර්ධන නිලධාරී | 2022.10.05 වන දින මුද්දර ගාස්තු උපලේඛන ලබා ගැනීමට මහනුවර ඉඩම් රෙජිස්ටාර් කාර්යාලයට සහ පල්ලෙකැලේ පළාත් සභා සංකීර්ණයට යාම වෙනුවෙන් ගමන් වියදම් ලබා ගැනීම | 1129 | | 1,418.00 |
| 14 | | එන්.පී.එස්.එස්.සෝමතිලක මයා - රියදුරු | 2022 සැප්තැම්බර් මස ගමන් වියදම් දීමනා ගෙවීම. | 1130 | | 7,000.00 |
| 15 | | ඩබ්.එම්.මද්දුම බංඩාර මයා - ජ්‍යේෂ්ඨ වැඩ අධිකාරී. | 2022 සැප්තැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් දීමනා ගෙවීම. | 1131 | | 12,200.00 |
| 16 | 2022-10-13 | ඩබ්.ජේ.පී ගුණරත්න මයා. ආදායම් පරීක්ෂක - ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව. | 2022.10.07 දින පැවති නව වරිපනම් කලාප හදුනාගැනීමේ ක්ෂේත්‍ර පරීක්ෂාව සහ දේපළ සමීක්ෂණ කටයුතු සදහා වූ ආදායම් පරීක්ෂකවරුන්ගේ සාකච්ඡාව වෙනුවෙන් සංග්‍රහ වියදම් සදහා ලබා ගත් අත්තිකාරම් මුදල් පියවීම. | 1132 | | 5,940.00 |
| 17 | | කේ.ඩී.ඒ පීරිස් මයා - යාන්ත්‍රික ඉන්ජිනේරු බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය -කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පේරාදෙණිය. | CPRD 0926 ට්‍රැක්ටරයේ වහළ අළුතින් සෑදීම වෙනුවෙන් ලබා ගත් ඉංජිනේරු නිර්දේශ වෙනුවෙන් පරීක්ෂණ ගාස්තු ගෙවීම. | 1133 | | 1,500.00 |
| 18 | | පී.කේ.පී.ඩබ්.පී බංඩාර මයා. නො.18/1/1 නාවලපිටිය පාර,ගම්පොළ. | ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ඊ නැණ පියස මධ්‍යස්ථානයේ අවශ්‍යතාවයට එකලස් කරන ලද පරිගණක 2 ක් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1134 | 25.00 | 178,975.00 |
| 19 | | රාක්ෂාව ගොවි සංවිධානය - පරගල ජනපදය,උඩහේන්තැන්න. | 2021 වර්ෂයේ සභා අරමුදල් මගින් ක්‍රියාත්මක කරන ලද පරගල පහළ නන්දසිරි මහතාගේ නිවස ළග සිට ඉතිරි කොටස උපාලි වික්‍රමසිංහ මහතාගේ නිවස දෙසට මාර්ගය සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ අතරැදි මුදල් ගෙවීම. | 1135 | | 9,503.59 |
| 20 | | රාක්ෂාව ගොවි සංවිධානය - පරගල ජනපදය,උඩහේන්තැන්න. | 2022 වර්ෂයේ සභා අරමුදල් මගින් ක්‍රියාත්මක කරන ලද පරගල පහළ නන්දසිරි මහතාගේ නිවස ළග සිට අලිමංකඩ දක්වා පාර සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ අතරැදි මුදල් ගෙවීම. | 1136 | | 8,292.63 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 21 | | කදුරට හාර්ඩ්වෙයාර් - අංක 02, කුරුදුවත්ත | ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ මුරකරුගේ අවශ්‍යතාවය සඳහා විදුලි පන්දමක් හා ප්‍රධාන ගේට්ටුවට හා මුරකරුගේ මුර කුටියට අවශ්‍ය ඉබ්බෙක් ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1137 | | 4,420.00 |
| 22 | | ආර්.එම්.එම්.පි බංඩාර මයා.-කුරුදුවත්ත කඩ විදිය. | ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ වෙබ් අඩවිය නිර්මාණය කිරීමට ඩ්‍රෝන කැමරා යොදා ගෙන ජායා රූප ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 1138 | | 7,500.00 |
| 23 | | එන්.යූ.පී.ඊ.එස් විමලරත්න - අසංක හාර්ඩ්වෙයාර් ,අංක 01, කුරුදුවත්ත කඩ විදිය. | ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ආයුර්වේදයට අයත් ඖෂධ උයනේ ඇති පොකුණ අළුත්වැඩියා කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය මිළට ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 1139 | | 3,380.00 |
| 24 | | සී/ස සදීපා පොත්හල - 1060,මරදාන පාර කොළඹ 08 | කුරුදුවත්ත,ඇත්ගාල,උලපනේ මහජන පුස්තකාල සඳහා සදීපා පොත්හලෙන් පොත් මිළදී ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1140 | | 700,000.00 |
| | | **එකතුව** | | | **101,853.06** | **2,658,698.80** |

<u>09. වෙනත්</u>

<u>01. ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඒ. මහින්දරත්න අලුත්ගමගේ මහතා</u>

**ගරු සභාපතිතුමනි,වෙළඳ භාණ්ඩ මිල ඉහළයාම සම්බන්ධයෙන් ජනතාව අපහසුතාවයට පත්වී ඇති කාලයක බේකරි නිෂ්පාදනවල බර සම්බන්ධයෙන් ගැටලුවක් පවතිනවා.එක් පාන් රාත්තලක් විකිණීමට නියමිත බර වන්නේ ග්‍රෑම් 400ක් වුවත් ඇතැම් පාන්වල බර ග්‍රෑම් 290ක් තවත් පාන් රාත්තලක බර ග්‍රෑම් 265ක් වශයෙන් තිබූ බැවින් බේකරි නිෂ්පාදනවල නියමිත බර පවත්වාගෙනයාම සම්බන්ධයෙන් බල ප්‍රදේශයේ බේකරි හිමියන් දැනුවත් කළ යුතුයි. අනෙකුත් නිෂ්පාදනවලත් බර සම්බන්ධයෙන් නිසි ප්‍රමිතියක් නැහැ.බල ප්‍රදේශය තුළ මේ සඳහා බලපත්‍ර නිකුත් කරන්නේ ප්‍රාදේශීය සභාව විසින් වන බැවින් මේ සම්බන්ධයෙන් සොයා බලා කළු කඩ ව්‍යාපාර නතරකිරීමේ වගකීම ප්‍රාදේශීය සභාව සතු වෙනවා.පාරිභෝගික සේවා අධිකාරිය මේ සම්බන්ධව දැනුවත් කරන ලෙස ඉල්ලා සිටිනවා.**

<u>ගරු සභාපතිතුමා</u>

**පාරිභෝගික සේවා අධිකාරිය මේ සම්බන්ධව දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස ලේකම්තුමියට දන්වා සිටිනවා.**

**02. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.චාමික අනුරාධ රත්නායක මහතා අසනීපවීම හේතුවෙන් අද දින නිවාඩු අනුමත කරදෙන ලෙස ඉල්ලීමක් කර ඇත.**

**එම නිවාඩු ඉල්ලීම අනුමත කරන ලදි.**

**03.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආනන්ද කුලතිලක මහතා අසනීප තත්ත්වයෙන් පසුවන බැවින් අද දින නිවාඩු අනුමත කරදෙන ලෙස ඉල්ලීමක් කර ඇත.**

**එම නිවාඩු ඉල්ලීම අනුමත කරන ලදි.**

**04.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අජිත් ප්‍රියන්ත බණ්ඩාර මහතා අසනීප තත්ත්වයෙන් පසුවන බැවින් අද දින නිවාඩු අනුමත කරදෙන ලෙස ඉල්ලීමක් කර ඇත.**

**එම නිවාඩු ඉල්ලීම අනුමත කරන ලදි.**

<u>ගරු සභාපතිතුමා</u>

**අද දින මහා සභා රැස්වීම සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන්ලාට ස්තූතිවන්තවන බව ප්‍රකාශ කරන ලදි. අද දින සභාවාරය සාර්ථකව පවත්වාගෙන යාමට සහාය**

**ලබාදුන් සියලුදෙනාටත් ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ඇතුළු කාර්යය මණ්ඩලයේ සියලුදෙනාටත් ස්තූතිවන්ත වෙමින් ගරු සභාපතිතුමා විසින් සභාවේ වැඩ කටයුතු පෙ:ව: 12.10 ට අවසන් කරන ලදි.**

**සභාපති**

**ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව**

**2022.10.18 වනදින ගඟ ඉහළකෝරළේ**

**ප්‍රාදේශීයසභා රැස්වීම්ශාලාවේදීය**